**පුවත්පත් නිවේදනයයි.**

**ජූලි 23 වන දා**
**සවස හතරට**
**`දෘශ්‍ය පෙළඹුම්'**
**දෘශ්‍ය කලා ප්‍රදර්ශනය**
**ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී**

අදින් අවුරුදු 41 කට පෙරාතුව ඇවිල වූ කළු ජූලිය සලකුණු කරමින් වසරක් පාසා පවත්වන ලබන චන්ද්‍රගුප්ත තේනුවරගේ ***පාර-යථාව*** (Meta-Real) ඒක පුද්ගල දෘශ්‍ය කලා ප්‍රදර්ශනය සස්කියා ප්‍රනාන්දු කලාගාරයේ දී ජූලි 23 පස්වරු 6.00 ට ආරම්භ කිරීමට නියමිතය. එකී ප්‍රදර්ශනයට සමගාමීව තරුණ පරම්පරාවේ සමකාලීන කලාකරුවන් හා කලාකාරිනියන්ගේ දෘෂ්ටිකෝණයෙන් ගොඩනැගුණු *දෘශ්‍ය පෙළඹුම්* (Visual Persuasions) දෘශ්‍ය කලා ප්‍රදර්ශනය එදිනම (ජූලි 23 දා) ප.ව. 4.00 ට ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී ආරම්භ වේ. මෙම ප්‍රදර්ශනය චන්ද්‍රගුප්ත තේනුවරගේ අභිරක්ෂණයකි.

දෘශ්‍ය පෙළඹුම් ප්‍රදර්ශනයේ සිත්තර සිත්තරියන් නියෝජනය කරන්නේ ඔවුනගේ පෞද්ගලික අත්දැකීම් සමඟ සමාජය හා ගැටෙන ඔවුන්ගේ ජීවන භාවිතාවන්ය. සිය ජීවිත ගමන අභිමුවට පැමිණෙන යුද්ධ හා අරගල/ ඝාතන/ අතුරුදහන් කිරීම්/ ආගමික ඇදහිලි/ සමාජ ධූරාවලින් වැනි සමාජ, ආගමික, සංස්කෘතික හා දේශපාලන ප්‍රස්තුතයන් සමඟ ගැටගැහෙන ඔවුනගේ සමාජයීය සංවේදනාවන්ය.

2024 වසරේ `දෘශ්‍ය පෙළඹුම්' දෘශ්‍ය කලා ප්‍රදර්ශනය සඳහා සහභාගිවන **ශානිකා විජේසිංහ** 'අරගලයේ' තීව්‍ර අවස්ථාවක ස්වකීය පෞද්ගලික සහ සමාජයීය අත්දැකීම් චිත්‍රමය භාෂාවකින් ඉදිරිපත් කරන අතර, **කිරුෂ්ණානන්තන් අයිංකරන්** සිය මූර්ති ත්‍රිත්වයෙන් `නිජබිම' තේමා කරගනී. **කුසල් ගුණසේකර** සිය චිත්‍රය මගින් යුද්ධයේ හා දේශපාලන බිමේ ඉතාම බිහිසුණු හා වේදනාකාරී අත්දැකීමක් වන අතුරුදහන්වූවන් පිළිබඳ මතකය නින්නාදවීමට ඉඩ හරියි. **රවිඳු සඳරුවන්** එක්ස්ප්‍රෙස් - පර්ල් නෞකාව ගෙන ආ සිදුවීම්දාමය සමඟ සාගරයට ඇති සිය බැඳීම් තේමා කරගත් දියසායම් කෘතියක් ඉදිරිපත් කරද්දී , **අරුණශාන්ත කුලතුංග** මිශ්‍ර ලෝහ මූර්තිමයෙන් සංවේදී වන්නේ සංක්‍රාන්තික ලිංගිකයින් පිළිබඳ සමාජමය ගැටළුවක් සන්නිවේදනය කිරීමටයි. **සුසිමන් නිර්මලවාසන්** මානව හිමිකම් අගයන ලෝකවාසීන් විරුද්ධව හඬ නගද්දීත් තවමත් සිදුවෙමින් පවතින මහා මිනිස් ඝාතනයට ස්වකීය විරෝධය දෘශ්‍ය භාෂාවෙන් මැදිහත් වෙයි. **ෆාතිමා අව්රාද්** යාඥා පලස මතින් පැන නඟින ආගමික - ඇදහිලි විශ්වාසයන් හා සංස්කෘතිකමය භාවිතාවන් සමඟ පැන නගින හිස් අගයන් ප්‍රශ්න කරන්නීය. **ගෝපාලපිල්ලෙයි මතිස්කුමාර්** පැල්පත් ජනාවාස හා- සමාජ පරතරයන් කෙරෙහි අවධානය යොමුකරයි. -

මෙම සිත්තර සිත්තරියන්ගේ අට දෙනාගේ දෘශ්‍යමය ඒත්තු ගැන්වීම නොහොත් `දෘශ්‍ය පෙළඹුම්' ජූලි 24 වැනි දා සිට ජූලි 31 දක්වා ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී (පෙව 10.00 සිට පව 6.00) පැවැත් වේ.

**'Home/ Land'**
**(නිජ/ බිම) දෘශ්‍ය කලා ප්‍රදර්ශනය - JDA කලාගාරයේ දී, 23 වැනි දා ප:ව 5.00 ට**

දෘශ්‍ය කලාවේදී චන්ද්‍රගුප්ත තේනුවරගේ ආරාධනයෙන් 'Home/ Land' නමින් සමූහ ප්‍රදර්ශනයක් කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ ජේ.ඩී.ඒ පෙරේරා කලාගාරයේ දී ජූලි 23 වැනි දින පස්වරු 5.00 ට ආරම්භ කෙරේ. ජාත්‍යන්තර හවුල්කාරී සහයෝගිතා අංගයක් ලෙසට එළිදැක්වූ මෙම 'Home/ Land' ප්‍රදර්ශනයේ අභිරක්ෂක (Curator) වන්නේ ටී. සනාතනන් කලාකරුවායි.

චන්ද්‍රගුප්ත තේනුවරගේ පාර-යථාව ('Meta-Real')දෘශ්‍ය කලා ප්‍රදර්ශනයට සමගාමීව ඉදිරිපත් කරන 'Home/ Land' ප්‍රදර්ශනයෙන් දිවයින පුරා පැවති ප්‍රචණ්ඩත්වය හා එයින් ජන සමාජය වෙත ඇති කළ මහත් බලපෑම පිළිබඳව ගැඹුරු සංවේදනාවන් නිරූපිතය. තම ගේ - දොර, ඉඩකඩම්, උපන් ගම් බිම් හා අහිමි වීම්, මතකයන් යනාදි අත්දැකීම් සම්භාරයක් සමඟ යාපනය අර්ධද්වීපයේ ජනතාවට හා එහි භූමි

භාගයට යුද්ධයෙන් වූ බලපෑම - අවතැන්වීම් - පිටුවහල් කිරීම් - සම්බාධක හරහා ගෙවී ගිය පොදු ජන ජීවිතයේ ආත්මීය මතකයන් ප්‍රදර්ශනය සඳහා සහභාගි වන දෘශ්‍ය කලාවේදීන්වන *මරියතේවදාස් විජිතරන්, සෝමීතරන්, ජස්මින් මිලානි ජෝසප්, මනෝ ප්‍රශාන්, සුන්දරම් අනෝජන්, ටී. ක්‍රිෂ්ණප්‍රියා* සහ සොමිතරන් තම කලා කෘති මගින් ගවේෂණය කරයි.

'Home/ Land' ප්‍රදර්ශනය විවෘත කෙරෙන්නේ ජූලි 23 ප:ව 5.00 සිට ප:ව 7.00 දක්වා ය. එය ජූලි 24 සිට ජූලි 31 දක්වා ජේ.ඩී.ඒ කලාගාරයේ දී (පෙ:ව 10.00 - ප:ව 6.00) දක්වා මහජනයා සඳහා විවෘතය

**මෙම සමගාමී ප්‍රදර්ශන ද්වය සඳහා අනුග්‍රාහකත්වය:**

විභවි ලලිත කලා ඇකඩමිය
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA)
හා සස්කියා ප්‍රනාන්දු ගැලරිය මඟිනි.